සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

දෙවන වාර ඇගයීම

- 2018

Second Term Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade 6 | විෂයය / பாடம் / Subject කතෝලික ධර්මය | පත්‍රය / வினாத்தாள் / Paper 1,2 | පැය / மணித்தியாலம் / Hours 02 |

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න**
- **අංක 1 සිට 20 දක්වා දී ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

## 1 පත්‍රය

1/ කිතුන් අපගේ ජීවිතයේ විශ්වාසයේ හා බලාපොරොත්තුවේ පදනම වන්නේ
1. පුරාණ ගිවිසුමයි 2. ශුද්ධ බයිබලයයි 3. සීනයි ගිවිසුමයි 4. නව ගිවිසුමයි

2/ නික්මයාම පොතේ ඇතුළත් කරුණු වන්නේ
A- සීනයි කන්දේ දී දස පනත ලබා දීම B- නෝවා සහ ජල ගැල්ම
C- මෝසෙස් තුමාගේ දූත මෙහෙවර D- මිනිසා ඉදි කළ බාබෙල් කොත
මින් වඩාත් නිවැරදි පිළිතුර වන්නේ
1. B හා D 2. C හා D 3. A හා C 4. A හා B

3/ ශු.මාක් සුභාරංචි ග්‍රන්ථයේ සංකේතය වන්නේ................................. ය. මෙහි හිස් තැනට සුදුසු වචනය වන්නේ
1.සිංහයා 2. මිනිසා 3. ගවයා 4. රාජාලියා

4/ දෙවියන් වහන්සේ 5 වන දවසේ මවන ලද්දේ
1. ඉර , හඳ හා තාරකා 2. සතුන් හා මිනිසා 3. අහස හා ජලය 4. පක්ෂීන් හා මසුන්


5/ වර්තමාන මිනිසා දේව මැවිල්ල ආරක්ෂා කිරීමට ගන්නා පියවරකි
1. වනාන්තර විනාශය 2. පොලිතින් භාවිතය 3. පරිසර දූෂණය 4. වන වගාව ඇරඹීම

6/ මිනිසා සියලු ගවමහිෂයන්ට ද අහසේ පක්ෂීන්ට ද සියලු .......................නම් තැබීය. (උත්පත්ති 2:20) ට අනුව හිස්තැනට අදාළ පිළිතුර වන්නේ
1. සතුන්ට 2. මිනිසුන්ට 3. මෘගයන්ට 4. උරගයන්ට

7/ රෝම අධිරාජයේ සියලු වැසියන්ගේ සංගණනයක් ගැනීමට නියෝග දුන් අධිරාජ්‍යයා වන්නේ
1. ඇන්ටිඔකස් අධිරාජ්‍යයා 2. අගෝස්තුස් අධිරාජ්‍යයා 3. ඩොමිෂයන් අධිරාජ්‍යයා 4. නීරෝ අධිරාජ්‍යයා

8/ ජුදා සිරිතට අනුව ජේසුස් වහන්සේගේ දෙමාපියෝ අවුරුදු පතා පාස්කු මංගල්‍යට ගියේ කොහාටද?
1. ජෙරුසලමට 2. බෙත්ලෙහෙමට 3. මිසරයට 4. රෝමයට

9/




ඉහත රූප සටහනේ හිස්තැනට අදාළ ප්‍රසාද නිධානය වන්නේ
1. ප්‍රසාද ස්නාපනය / රෝගීන්ගේ ආලේපයය 2. රෝගීන්ගේ ආලේපය / දිව්‍ය සත්ප්‍රසාදය
2. සමගි සන්ධානය / රෝගීන්ගේ ආලේපය 4. දිව්‍ය සත්ප්‍රසාදය / සමගි සන්ධානය

10/ ප්‍රසාද ස්නාපනයේ දී ශුද්ධාත්ම වරම් ලැබීම සඳහා භාවිතා වන සංකේතය වන්නේ
1. පාස්කු ඉටිපහන 2. ශුද්ධ වූ තෛලය 3. සුදු වස්ත්‍රය 4. ජලය

11/ ටියුරින් නුවර ශ්‍රී සළුවෙන් ලන්චියානෝ නුවර මස් කැබැල්ලේ හා රුධිරයේ ඇත්තේ A B පොසිටිව් බව .................. විසින් අනාවරණය කරන ලදී. හිස් තැනට අදාළ පිළිතුර වන්නේ
1. ශු.ජුසේවාස් මුනිතුමා 2. ශුද්ධ වූ සභාව 3. ශු. ජෙස්ටින් තුමා 4. නාසා ආයතනය

12/ පාස්කු ඉරුදින සැඳෑවේ උත්ථාන වූ ජේසුස් වහන්සේ අපොස්තුලුවරුන්ට දර්ශනය වී ස්ථාපිත කළ දේව ප්‍රසාද නිධානය නම්
1. සමගි සන්ධානය යි 2. රෝගීන්ගේ ආලේපය යි 3. ප්‍රසාද ස්නාපනය යි 4. අභිවෘධි ආලේපය යි

13/ සියලු කාරණා වලදී ......................... කීකරු වන්න. (කොලොස්සි 3: 2) මෙහි හිස්තැනට අදාළ පිළිතුර වන්නේ
1. ගුරුවරුන්ට 2. දේව ජනතාවට 3. වැඩිහිටියන්ට 4. දෙමාපියන්ට

14/ දහවන දේව පනතින් අපට නියම වන්නේ
1. අපගේ සෞඛ්‍ය ගැන සැලකිලිමත් වීම 2. අනුන්ගේ අයිතියට ගරු කිරීමට
3. ලද පමණින් සතුටු වීම 4. සෑම කාරණයක දීම සත්‍යවාදී වීම

15/ තමන් සෑදූ රන් රූපය ඉවත ලා සැබෑ වූ එකම දෙවියන් වහන්සේ ට වන්දනා කරන්නට පටන් ගත් රජතුමා වන්නේ
1. නෙබුකද්නසර් රජතුමා 2. දාවිත් රජතුමා 3. සලමොන් රජතුමා 4. හෙරෝද් රජතුමා

16/ ඉරු දින හා ණය මංගල්‍යය දින වල දී අප කළ යුතු දෙය වන්නේ
1. විනෝද චාරිකා යාම 2. දිව්‍ය පූජාවට ක්‍රියාශීලීව සහභාගි වීම
3. උපකාරක පන්ති වලට යෑම 4. නිවාඩු ගෙන ගෙදර සිටීම

17/ මර්යදාවට අනුකූලව ඇඳුම් පැළඳුම් භාවිතය වැදගත්ය. මෙයට අදාළ දේව පනත වන්නේ
1. 6 වන හා 9 වන පනත් 2. 7 වන හා 10 වන පනත් 3. 5 වන හා 7 වන පනත් 4. 4 වන හා 6 වන පනත්

18/ “ ස්වාමීන් වහන්ස, මේ පාපය ඔවුන් පිට නොතැබුව මැනව. “ යි පැවසුවේ කවුද?
1. ක්‍රිස්තුස් වහන්සේ 2. ශු. ස්තේපන් තුමා 3. ශු. පාවුලු තුමා 4. ශු. දෙවන ජුවාම් පාවුලු මුනිතුමා

19/ “ ඔබේ සතුරන්ට ප්‍රේම කරන්න. ඔබට පීඩා කරන්නන් උදෙසා...................“.හිස් තැනට සුදුසු පිළිතුර වන්නේ
1. ප්‍රේම කරන්න 2. වෛර කරන්න 3. යාච්ඤා කරන්න 4. එකට එක නොකරන්න

20/ අටවන දේව පනතට විරුද්ධව කරන පාපයකි.
1. දෙවි පියාණන් වහන්සේ කෙරෙ හි විශ්වාසයෙන් සිටීම
2. සෑම විටම සත්‍ය පමණක් ප්‍රකාශ කිරීම
3. අධිකරණයේ දී දිව්රා අසත්‍ය ප්‍රකාශ කිරීම
4. අන්‍ය ආගමික වත්පිළිවෙත් වලට සහභාගි වීම

(ලකුණු 2x20 =40)

## 2 කොටස - 6 ශ්‍රේණිය

- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.**
- **පළමු ප්‍රශ්නයට ලකුණු 16 ක් ද තෝරාගත් අනික් ප්‍රශ්නයකට ලකුණු 11 බැගින් ද හිමිවේ.**

1. දේව ප්‍රසාද නිධාන සම්බන්ධයෙන් ඔබේ පන්ති කාමරය තුළ කරන ලද ඇගයීම් ක්‍රියාකාරකම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   (1) ඉහත ඇගයීම ක්‍රියාකාරකම සඳහා ඔබ කරුණු සපයා ගත් ආකාර 2 ක් ලියන්න ( ලකුණු 2)
   (2) සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය නිසි ලෙස ලබා ගැනීමට අවශ්‍ය පියවර 2ක් ලියන්න (ලකුණු 2)
   (3) රෝගීන්ගේ ආලේපය ලැබිය යුතු අවස්ථා 3 ක් ලියන්න (ලකුණු 3)
   (4) රෝගීන්ගේ ආලේපය නැමති දේව ප්‍රසාද නිධානයෙන් ලැබෙන වරප්‍රසාද 3ක් ලියන්න (ලකුණු 3)
   (5) ඔබගේ නිවස අසල සිටින කතෝලික රෝගියෙකු වෙනුවෙන් ඔබට පැවරෙන වගකීම් 3 ක් ලියන්න. ( ලකුණු 6)

2. (1) ශුද්ධ බයිබලයේ ගීතාවලිය පොතේ 14 පරිච්ඡේදයෙන් අපට පැහැදිලි කර දෙන්නේ කුමක්ද? (ලකුණු 2)
   (2) ඔබේ පාසලේ පරිසරය අලංකාර කිරීමට ඔබට කළ හැකි කාර්යන් 3ක් ලියන්න (ලකුණු 3)
   (3) අපට අවශ්‍ය හැම දෙයක් ම මේ ලස්සන ලෝකය තුළ මවා දුන් දෙවි පියාට තුති පුදමින් යාච්ඤාවක් ලියන්න. (ලකුණු 6)

3. (1) ශුද්ධ වූ පවුල ජාතික හා ආගමික චාරිත්‍ර වලට ගරු කළ අවස්ථා දෙකක් ලියන්න (ලකුණු 2)
   (2) දොළොස් වියේ දී ජේසු කුමරු ජෙරුසලම් දේව මාළිගයෙහි නතර වූයේ කුමක් සඳහාද? (ලකුණු 3)
   (3) ළමා ජේසු තුමාගේ ජීවිතයෙන් ඔබට ගත හැකි ආදර්ශ 3 ක් ලියන්න (ලකුණු 6)

4. (1) සේවය සඳහා ස්ථාපිත දේව ප්‍රසාද නිධාන දෙක ලියන්න (ලකුණු 2)
   (2) පූජාප්‍රසාදින් වහන්සේලාගේ සේවාවන් 3ක් ලියන්න (ලකුණු 3)
   (3) පූජාප්‍රසාදිතුමන්ලාගේ කාර්ය සාර්ථක කර ගැනීම සඳහා කිතුනු දරුවෙකු ලෙස ඔබට කළ හැකි කාර්යයන් 3 ක් ලියන්න (ලකුණු 6)

5. (1) පළමුවන දේව පනත ලියන්න (ලකුණු 2)
   (2) පළමුවන දේව පනතට විරුද්ධව කරන පාපයන් 3ක් ලියන්න (ලකුණු 3)
   (3) පළමුවන දේව පනතට අනුව ඔබ කළ යුතු දේ කරුණු තුනකින් ලියා දක්වන්න (ලකුණු 6)

6. (1) ශ්‍රී ලංකාවේ කතෝලිකයන්ට නියම වන ණය මංගල්‍ය දිනයන් 2 ක් ලියන්න (ලකුණු 2)
   (2) ඉරුදින අප විශේෂයෙන් සිහිපත් කරන සිදුවීම කුමක්ද? (ලකුණු 3)
   (3) ඉරුදින දිව්‍ය පූජා යාගයට ක්‍රියාකාරී ලෙස සහභාගී වීම සඳහා ඔබ කරන ක්‍රියාවන් 3ක් ලියන්න (ලකුණු 6)

7. (1) ශුද්ධ බයිබලයේ ශුභාරංචි කතුවරුන් හතර දෙනාව නම් කරන්න (ලකුණු 2)
   (2) පහත සඳහන් අවස්ථා වලදී ඔබ අන්‍යයන්ට ශුභාරංචියක් වන ආකාරය ලියා දක්වන්න (ලකුණු 3)

I. ඔබගේ පන්තියේ නිරාහාරව සිටින මිතුරෙක් හෝ මිතුරියක් දුටු විට
II. වැරදි දෙයකට යොමු වී ඇති ඔබේ මිතුරෙක් හෝ මිතුරියක් දුටු විට
III. දේවස්ථානය තුළ විහිළු තහළු කරන ඔබේ මිතුරෙක් මිතුරියක් දුටු විට